**ගල්නෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතට අනුව ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට හෝ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව පිළියෙල කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ මුද්දර බදු ආදායම රු.182,050 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර බදු ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි තොරතුරු පදනම්ව ගිණුම් ඉදිරිපත් කළයුතු වේ. | 2018 වර්ෂයේ මුද්දර බදු ආදායම රු182050 ක් ලෙස ගිණුම්ගත කිරිමට සිදුවී ඇත්තේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් ආදාල ගණනය කිරිම් සිදු කර වටිනාකම් අප වෙත ලබා දිමේදි ඉතා දිර්ස කාලයක් ලබා ගන්නා බැවිනි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2001 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ සභාව ටෙන්ඩර් මත බදුදීම්වලින් රු.384,573 ක් අයවිය යුතුව තිබුණු විය. | හිග බදු අයකිරිමට කටයුතු කලයුතුය. | ඉදිරියේදි අය කර ගැනිමට කටයුතු යොදා ඇත. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම් |
|---|---|---|
| වටිනාකම රු.1,710,607 ක් වූ ගිණුම් විෂයයන් 8 කට අදාළව විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය | මූලා ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | විස්තරාත්මක ලේඛන සහ වයස් විශ්ලේෂණ ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| මෝටර් ප්‍රවාහන පනත 203 අධිකාරිය 2(1) වගන්තිය | 5,163,870 | සභාවේ බවුසරයක් ට්‍රැක්ටරයක් හා ටේලර් 02 ක් ලියාපදිංචි නොකරමින් ධාවනයේ යොදවා තිබුණි. | පනත අනුව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදි ලියාපදිංචි කිරිමට කටයුතු කරමි. |

1.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් අත්හැරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්ති ප්‍රකාරව සභාවේ යෝජනා සම්මතය සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගනිමින් රු.3,007,357 ක් සමාලෝචිත වර්ෂයේදි කපාහැර තිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හිග මුද්දර බදු, කර්මාන්ත ණයගැතියෝ, ආදායම් ණයගැතියෝ නිවැරදි ශේෂ ගැලපිම් කිරිම සඳහා අදාල වටිනාකම පොත් වලින් කපා හැරිම සිදු කරන ලදී. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,360,892 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,520,361 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,089,000 | 1,106,750 | 1,088,500 | 590,650 | 800,000 | 1,084,600 | 1,084,400 | 573,500 |
| කුලී | 462,000 | 557,500 | 460,300 | 247,578 | 462,000 | 451,500 | 439,722 | 150,378 |
| බලපත්‍ර ගාස්තු | 2,022,900 | 2,329,420 | 2,293,340 | 819,898 | 1,758,750 | 2,431,390 | 2,103,040 | 742,668 |
| වෙනත් ආදායම් | 13,343,320 | 16,775,264 | 13,326,089 | 9,799,584 | 8,300,900 | 15,033,557 | 15,457,239 | 6,271,309 |
| | 16,917,220 | 20,768,934 | 17,168,229 | 11,457,710 | 11,321,650 | 19,001,047 | 19,084,401 | 7,737,855 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.7,737,856 ක් ව තිබුණු මුළු හිඟ ආදායම දෙසැම්බර් 31 දින වන විට රු.11,457,711 ක්ව පැවතුණි. | හිග අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අය කර නොතිබුණි. | දියුණු කල ප්‍රදේශ ගැසට් කර වරිපනම් ආදායම් රැස්කර ගැනීමට කටයුතු කල යුතු වේ | වරිපනම් බදු අයකර ගැනිම සඳහා දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් කලාප ලෙස නම් කිරිමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 314 කින් අයවිය යුතු හිඟ කසල බදු රු.590,650 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල කසල බදු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | 2019 ජනවාරි සිට මැයි 30 දක්වා කාලපරිච්ඡේදය තුල රු.52,550 එකතු කර ගැනිමට කටයුතු සිදු කර ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.8,803,884 හා මුද්දර ගාස්තු රු.840,700 ක් විය. | අදාල මුදල් ලබාගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 734 කින් අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තු රු.255,425 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. පැහැර හැරීම් පිළිබද නීතිමය පියවර ගත යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |

2.2.6 කර්මාන්ත ව්‍යාපාර බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 136 කින් අයවිය යුතු හිඟ ව්‍යාපාර බදු රු.169,500 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | 2019 ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුල රු.4,700 ක් එකතු කර ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර ගණනාවක සිට පැවත එන එකතුව රු.2,042,323 ක් වටිනා යන්ත්‍ර උපකරණ අයිතම් 36 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීම හෝ අපහරණය කිරිම සඳහා කටයුතු කල යුතු වේ. | ඉදිරියේදි මෙම වත්කම් ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009/(1)(i) දරන මුදල් අමාත්‍යාංශ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |